**රත්නපුර ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 20 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල තැන්පත් ලැබීම් රු. 11,594 කින් අඩුවෙන් හා තැන්පත් ගෙවීම් රු. 23,625 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබූ රු. 7,178 ක් වූ පරිගණක මේසයක් ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු. 14,700 ක් වූ වැකුම් ක්ලීනර් යන්ත්‍රය අයභාර වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන වියදම් හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාල රු. 60,163 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස උපචිත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා ණයහිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ එකතුව රු. 17,850 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**----------------------------**

ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ උපයෝගී ලේඛන අනුව ශේෂය අතර එකතුව රු. 4,724,355 ක වෙනසක් විය.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**-------------------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | දෙනලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, සභාව විසින් අවස්ථා 23 කදී දෙනලද එකතුව රු. 1,347,591 ක් වූ අතුරු අග්‍රිම 23 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණු අතර, අදාල කාල ප්‍රමාදය අත්තිකාරම් ලබාදුන් දින සිට වර්ෂ 11 සිට මාස 05 දක්වා කාලපරාසයක පැවතුණි. |

| | |
|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 395(ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවත්, 2016 සැප්තැම්බර් වනවිටත් 2016 ජනවාරි සිට ජූලි දක්වා වූ බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්මවා තිබූ එකතුව රු. 65,759 ක් වූ විවිධ තැන්පතු 13 ක් සහ ව්‍යාපෘති 06 කට අදාල එකතුව රු. 517,567 ක් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 4,160,459 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 7,479,511 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,319,052 ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 3,319,052 කින් අඩුවීම කෙරෙහි ආදායම් විෂයයන් 02 ක රු. 7,387,967 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 301 | 292 | 67 |
| බදු කුලී | 766 | 261 | - |
| බලපත්‍ර ගාස්තු | 525 | 680 | 183 |
| වෙනත් ආදායම් | 41,165 | 24,129 | 23,381 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 02, සියයට 32 හා සියයට 11 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 66, සියයට 20, සියයට 67 හා සියයට 64 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

සභා බල ප්‍රදේශය තුල පවත්නා දියුණු ගම් ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකර ගැනීමට තීරණය කර තිබූ බව 2013 පෙබරවාරි 23 දිනැති මහ සභා වාර්තාව අනුව අනාවරණය වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයවිය යුතු ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකිරීමකින් තොරව සභාවට ලැබෙන බදු ආදායම පමණක් ලේඛනගත කර තිබුණි. 2016 සැප්තැම්බර් 01 දින වනවිට ඉකුත් වර්ෂයට රු. 233,350 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයවූ ආයතන 464 කින් සමාලෝචිත වර්ෂයට බලපත්‍ර ගාස්තු අයවී නොතිබීම පිළිබඳව සභාව පසුවිපරම් කර නොතිබුණි.

**2.3.5 වෙනත් ආදායම්**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලසීමාවට අදාල උසාවි දඩ ආදායම 2017 ජුනි වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධනය**

**----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය අනුව, සභා අරමුදල් සහ වෙනත් ආධාර යටතේ පිළිවෙලින් රු. 23,000,000 ක් හා රු. 105,000,000 ක් වශයෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද, නිශ්චිත වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හඳුනාගෙන නොතිබුණි. එහෙත්, සභා අරමුදල් සහ වෙනත් ආධාර යටතේ පිළිවෙලින් රු. 8,607,242 ක් හා රු. 109,870,819 ක් වශයෙන් එකතුව රු. 118,478,061 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් විෂයයන් 06 ක් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබූ විෂයයන් 08 කට අදාල භාණ්ඩ ඒකක 45 ක් හා පොත් 28 ක ඌනතාවය සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දින වනවිටද මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සඳහා පවත්වා ගෙනයන බැංකු ගිණුම් 02 ක් වෙනුවෙන් එක් මුදල් පොතක් පවත්වා ගෙනගොස් තිබුණු අතර, මෙම තත්ත්වය 2016 දෙසැම්බර් 31 දින දක්වා නිවැරදි කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

සභාවට අයත් සුසාන භූමි 70 ක් පැවතියද, එම සුසාන භූමි මැනුම් කටයුතු කර සභාව වෙත විධිමත් පරිදි පවරාගෙන ලේඛනගත කර නොතිබුණි.

**3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------------**

සභාවට අයත් වාහන 03 ක් වර්ෂ කිහිපයක සිට ධාවන තත්ත්වයේ නොපැවතුණු අතර, 2016 නොවැම්බර් වනවිටද අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.5 ආර්ථික නොවූ ගනුදෙනු**

----------------------------

ඉදිරිපත් කල විදුලි බිල්පත් ලේඛනය අනුව 2012 දෙසැම්බර් සිට 2016 අගෝස්තු දක්වා පලාබද්දල සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය යන නමට යොමු කරන ලද විදුලි බිල්පත් වෙනුවෙන් එකතුව රු. 104,921 ක් ගෙවා තිබුණද, සභාවට අයත් මෙම ගොඩනැගිල්ල පොලිස් මුරපොලක් වශයෙන් පවත්වාගෙන යන ස්ථානයක් බව අනාවරණය විය.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) නිව් මීහිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය**

**-------------------------------------------------------------**

(i) උක්ත කර්මාන්තය සඳහා රු. 994,357 කට සී/ස මල්වල සණස සමිතිය සමඟ ගිවිසුම්ගතවී තිබුණු අතර, ඉදිකිරීම් ආරම්භ කරන ලෙසට සභාව විසින් දැනුම්දෙන ලිපියේ 03 ඡේදය ප්‍රකාරව අවශ්‍ය ගල්, වැලි වැනි ද්‍රව්‍ය වැඩබිමට ගෙනවිත් මුට්ටකර තැබූ බවට වාර්තාවක් සමිතිය විසින් සභාවට ලබාදිය යුතු බවට දැනුම් දී තිබුණද, සමිතිය විසින්

ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, ඇස්තමේන්තුව අනුව එම ද්‍රව්‍ය මුට්ට කිරීමේ අවශ්‍යතාවය පැවතුණි.

(ii) ඇස්තමේන්තුව ප්‍රකාරව කොන්ක්‍රීට් කලයුතු ප්‍රමාණය දිග අඩි 590 ක් වූ අතර, ගෙවීම් වාර්තාව අනුව දිග අඩි 609 ක් බවට නිරීක්ෂණය විය. එසේ වුවද, 2016 දෙසැම්බර් 16 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී කාර්මික නිලධාරියා විසින් දිග අඩි 654 ක් වශයෙන් පෙන්වන ලද අතර, ගෙවීම් කල ප්‍රමාණයට වඩා වැඩියෙන් දිග අඩි 45 ක් ඉටුකර ඇති බව දක්වා තිබුණි. එහෙත්, විවිධ කර්මාන්තයන් යටතේ විවිධ ආයතනයන් මඟින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කරන ලද මීහිටිය මාර්ගයේ මෙම කර්මාන්තයට අයත් කොටස කාර්මික නිලධාරීවරයා විසින් තම මූලික ඇස්තමේන්තු සැකසීමේදී හා මිනුම් වාර්තාවන්හිදී නිශ්චිතව හා පැහැදිලිව දක්වා නොතිබුණු අතර, විගණනය සමඟ පරීක්ෂා කරන අවස්ථාවේදී කර්මාන්තයට අයත් කොටස නිශ්චිතව හා පැහැදිලිව හඳුනාගැනීමට කාර්මික නිලධාරියාට නොහැකි විය.

(iii) ඉටු කරන ලද කර්මාන්තය වශයෙන් පෙන්වා දෙනලද මාර්ග තලයේ ආරම්භක කොටසේ ස්ථාන කිහිපයක කොන්ක්‍රීට් තලය කඩතොළු වී තිබූ අතර, ස්ථාන කිහිපයක සිමෙන්ති කොලොප්පු යොදා තිබුණි. අඛණ්ඩව ඉදිකර තිබූ අඩි 597 ක කොටසෙහි ස්ථාන කිහිපයක්ද, ඉතිරි අඩි 57 ක කොටසෙහි වැඩි ප්‍රමාණයකද ¾" ගල් මතුවී තිබුණි.

**(ආ) නුගේපොල දෙහෙනකන්ද මාර්ගය කොටසක් අළුත්වැඩියා කිරීම**

**------------------------------------------------------------------------**

(i) 2015 මාර්තු 27 දිනැති අංක FC/SABP/4/2/2015 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියක ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 25 ට අඩු කිසිඳු ක්‍රියාකාරකමක් අදියර වශයෙන් වෙන්කර එම එක් එක් සංවර්ධන වැඩ තනි වශයෙන් පෙන්වා ගිවිසුම්ගත නොකල යුතු බවට අවධාරණය කර තිබුණද, ඊට පටහැනිව රු. 2,161,556 ක් වූ ඇස්තමේන්තුගත වැඩ වටිනාකමක් සහිත එකම මාර්ගය අළුත්වැඩියා කිරීමට එක සමාන ඇස්තමේන්තු 02 ක් සකසා අනුමත සමිතියක් සමඟ එකම දිනකදී ගිවිසුම්ගතවී තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 16 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී, අඩි 248 සිට අඩි 343 දක්වා දිග අඩි 95 ක පමණ කොටසේ සියයට 80 ක් පමණ ඉදිකිරීම් සඳහා භාවිතා කරන ලද ABC මිශ්‍රණය හා ප්‍රිමික්ස් මිශ්‍රණය සම්පූර්ණයෙන් ගැලවී ගොස් තිබූ අතර, මාර්ගය ආරම්භක ස්ථානයේ සිට අඩි 100 ක් දුරින් මාර්ගයේ මැද දිග අඩි 2 පළල අඩි 1 අඟල් 6 ක පමණ වලක් සෑදී තිබුණි. ඇස්තමේන්තුව අනුව ප්‍රිමික්ස් යෙදීම 2.5" ක්

වශයෙන් දක්වා තිබුණද, භෞතික පරීක්ෂාව අනුව ½" ක් පමණ බව නිරීක්ෂණය විය. ඒ අනුව කර්මාන්තය අවසන් කර වර්ෂයක් වැනි කෙටි කාලයක් තුළ එම ඉදිකිරීම විනාශ වී යාම තුළින් ඉහත ඉදිකිරීම් නිසි ප්‍රමිතියකින් විධිමත් අධීක්ෂණයක් යටතේ සිදුකර නොමැති බවට නිරීක්ෂණය කෙරේ.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 50 කට අදාලව එකතුව රු. 7,825,043 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා විෂයයභාර නිලධාරියෙකුට වැඩ පැවරීමක් සිදුකර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, එම ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු. 564,476 ක් වූ විගණන විමසුම් 01 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වැය විෂයයන් නිවැරදිව වර්ගීකරණය නොකිරීම<br>(ii) ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම<br>(iii) ගිණුම් වලින් අත්හැරීම් |
| (ආ) | ආදායම් පරිපාලනය | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | වත්කම් නිෂ්කාර්යයව පැවතීම සහ භාවිතයට නුසුදුසු වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම |